*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2019

**6 ශ්‍රේණිය** **බුද්ධ ධර්මය** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- දෙවන කොටසේ පළමු පළමු ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I - කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.

01 සිදුහත් කුමාරයාගේ මව වූයේ,

(1) යශෝධරා දේවියයි. (2) මහාමායා දේවියයි.

(3) මහා ප්‍රජාපතී ගෝතමී දේවියයි. (4) කිසාගෝතමී දේවියයි.

02 යශෝධරා දේවියගේ පියා වූයේ,

(1) සුද්ධෝදන රජතුමා ය. (2) අමිතෝදන රජතුමා ය.

(3) සුප්‍රබුද්ධ රජතුමා ය. (4) කොසොල් රජතුමා ය.

03 සතර පෙරනිමිතිවල දෙවැන්න

(1) මහල්ලෙක් ය. (2) රෝගියෙක් ය. (3) මළ සිරුරක් ය. (4)පැවිදි රුවක් ය.

04 විහාරස්ථානයට ගොස් වන්දනා කරන පිළිවෙළ නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) බෝධීන් වහන්සේ, බුදු පිළිම වහන්සේ, වෙහෙර වහන්සේ.

(2) වෙහෙර වහන්සේ, බෝධීන් වහන්සේ, බුදු පිළිම වහන්සේ.

(3) බුදු පිළිම වහන්සේ, වෙහෙර වහන්සේ, බෝධීන් වහන්සේ.

(4) බුදු පිළිම වහන්සේ, බෝධීන් වහන්සේ, වෙහෙර වහන්සේ.

05 පහත දැක්වෙන වචනවලට භාවිතවන ශාසනික වචන පිළිවෙළට යෙදී ඇති පිළිතුර තෝරන්න.

* වතුර * අතුගානවා * මිදුල

(1) අමදිනවා, මලුව, පැන් (2) පැන්, මලුව, අමදිනවා

(3) පැන්, අමදිනවා, මලුව (4) අමදිනවා, පැන්, මලුව

- **අංක 06 සිට 10 දක්වා ප්‍රකාශවල දැක්වෙන වගන්ති හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ තිබෙන වරහනෙහි යොදන්න.**

06 මෙත් වැඩීමෙන් අපට ලැබෙන ආනිසංස ගණන 11 කි. ( )

07 කීකරුකම හා අවවාද පිළිගැනීම රාහුල හිමියන්ගේ චරිතයෙන් ගතහැකි ආදර්ශයන් ය. ( )

08 **''ධම්මානුවත්තී''** යන්නෙහි තේරුම කම්මැලි නැතිකම යන්නයි. ( )

09 මාතෘ භූමියෙහි සෞභාග්‍යය හා සෞන්දර්යය ජාතික ගීයෙන් හෙළිවේ. ( )

10 සම්මාවාචා හා සම්මා කම්මන්ත යන අංග දෙක පමණක් සීල ශික්ෂාවට අයත් වේ. ( )

- **අංක 11 සිට 15 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

( අනුපිය / පාණ්ඩව / මඝ / සුමන / සේනානි )

11 රජගහනුවර පිඬුසිඟා වැඩි බෝසතාණෝ .................................. පර්වතය පාමුල දී දන් වැළඳූ හ.

12 පැවිදි වූ බෝසතාණන් වහන්සේ අනෝමා ගඟ අසල ...................................... අඹ වනයෙහි විවේකයෙන් වැඩ සිටිය හ.

13 ......................................... මානවකයා අභියෝග ජයගත් තරුණයෙකි.

14 ශුද්ධාවෙන් යුතුව බුදුරදුන්ට මල් පූජා කළ ...................................... රජතුමාගෙන් ද තෑගි භෝග ලැබීය.

15 ........................................... නියම් ගමෙහි සිත්කළු වන ලැහැබක බෝසතාණෝ දුෂ්කර ක්‍රියාව සිදුකළ හ.

- **පහත A තීරුවේ දැක්වෙන තැනැත්තන් B තීරුවේ දැක්වෙන ස්ථාන සමග නිවැරදිව ගලපා යා කරන්න.**

| | A | | B |
|---|---|---|---|
| 16 | පස්වග තාපසයින් | 1. | දෙවුදහ නුවර |
| 17 | බිම්බිසාර රජතුමා | 2. | අම්බලට්ඨිකා ආවාසය |
| 18 | සුද්ධෝදන රජතුමා | 3. | කිඹුල්වත් නුවර |
| 19 | රාහුල හාමුදුරුවෝ | 4. | රජගහ නුවර |
| 20 | මහාමායා දේවිය | 5 | බරණැස ඉසිපතනය |

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

01 කෙටි පිළිතුරු ලියන්න.

(i) සිදුහත් කුමාරයා උපත ලැබුවේ කොහේදී ද?

(ii) පස්මහ බැලුම් වලින් දෙකක් නම් කරන්න.

(iii) ''සාධු වාචාය සංවරෝ'' යන්නෙහි තේරුම ලියන්න.

(iv) පන්සිල්වල දෙවැනි හා තෙවැනි සිල්පද ලියන්න.

(v) සම්මා කම්මන්තයට අයත් අංග දෙකක් නම් කරන්න.

(vi) නිවන් ලබාගැනීම සඳහා අත්හලයුතු අන්ත දෙක මොනවා ද?

(vii) පහත දැක්වෙන කවියෙහි ඉතිරි පද දෙක ලියන්න.

නුදුන් දෙයක් සොර සිතකින් නොගන්නෙමි
අනුන් ලවා සොරකම් නොකරවන්නෙමි
................................................................................
................................................................................

(viii) ජාතික කොඩියෙහි තිබෙන සිංහයා අත ඇති අසිපතෙන් සංකේතවත් වන්නේ කුමක් ද?

(ix) ජාතික කොඩිය ඔසවන අවස්ථා දෙකක් ලියන්න.

(x) ජාතික වෘක්ෂය බුදුදහමට සම්බන්ධවන ආකාරය පිළිබඳ කරුණු දෙකක් ලියන්න.

(ලකුණු 2 x 10 = 20 යි.)

02 (i) ත්‍රි ශික්ෂා වලින් දෙකක් නම් කරන්න.

(ii) සම්මා කම්මන්ත යන්න කෙටියෙන් හඳුන්වන්න.

(iii) සිල්වත්වීමෙන් ලැබෙන ආනිසංස පහ ලියන්න.

(ලකුණු 2 + 3 + 5 = 10 යි.)

03 (i) සිව් බඹ විහරණ වලින් දෙකක් නම් කරන්න.

(ii) දරුවන් විසින් දෙමාපියන්හට ඉටුකරනු ලැබියයුතු යුතුකම්වලින් දෙකක් ලියන්න.

(iii) ඔබේ මවට හා පියාට ඔබ ගෞරවයෙන් සලකන ආකාරය කෙටියෙන් ලියන්න.

(ලකුණු 2 + 3 + 5 = 10 යි.)

04 (i) බෞද්ධ ගිහියා ආරක්ෂා කරන නිත්‍ය ශීලය කුමක් ද?

(ii) මඝ මානවකයා ඇතුළු පිරිස ආරක්ෂා කළ ප්‍රතිපත්ති තුනක් නම් කරන්න.

(iii) එකමුතුව වැඩ කිරීමේ වටිනාකම පැහැදිලිවන වාක්‍ය පහක් ලියන්න.

(ලකුණු 2 + 3 + 5 = 10 යි.)

05 (i) ඔබ වන්දනා කටයුතු සඳහා විහාරස්ථානයට යන අවස්ථා දෙකක් නම් කරන්න.

(ii) පහන් පූජාකරන ගාථාව ලියන්න.

(iii) විහාරස්ථානයේදී සිදුකරන වතාවත් පහක් ලියන්න.

(ලකුණු 2 + 3 + 5 = 10 යි.)

06 (i) ''නතං කම්මං කතං සාධූ'' යන ගාථාව සම්පූර්ණ කර ලියන්න.

(ii) එහි සරල අදහස ලියන්න.

(iii) ඔබ සිදුකර තිබෙන යහපත් ක්‍රියා පහක් ලියන්න.

(ලකුණු 2 + 3 + 5 = 10 යි.)

07 (i) වෙනස්වීම බුදු දහමේ හඳුන්වන නම කුමක් ද?

(ii) වෙනස්වීම නිසා අපට පසුකිරීමට සිදුවන අවධි තුනක් ලියන්න.

(iii) ''ලෝකයේ පණ ඇති හා පණ නැති සියල්ල සෑම මොහොතකම වෙනස් වේ.'' මෙම කියමන සනාථ කෙරෙන ඔබ ජීවත්වන පරිසරයේ දකින මෙවැනි සිදුවීම් පහක් ලියන්න.

(ලකුණු 2 + 3 + 5 = 10 යි.)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | 2 | (02) | 3 | (03) | 2 | (04) | 2 | (05) | 3 | (06) | ✓ | | |
| (07) | ✓ | (08) | × | (09) | ✓ | (10) | × | (11) | පාණ්ඩව | (12) | අනුපිය | | |
| (13) | මස | (14) | සුමන | (15) | සේනානි | | | (16) | 5 | (17) | 4 | (18) | 3 |
| (19) | 2 | (20) | 1 | | | | | | | | | | |

(ල. 20 x 20 = 40)

## II - කොටස

01 (i) ලුම්බිණි සල් උයනේදී
(ii) මහල්ලෙක්, ලෙඩෙක්, මළ මිනියක්, පැවිදි රුවක්
(iii) වචනය සංවර කරගැනීම යහපත්ය.
(iv) අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි - කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි
(v) ප්‍රාණීන් මැරීමෙන් වැළකීම / සොරකමෙන් වැළකීම / කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම
(vi) කාම සුකල්ලිකානුයෝගය / අත්ත කිලමථානුයෝගය
(vii) හොරෙන් ගැනුම අනුමත නොම කරන්නෙමි
ලැබෙන්නකින් සතුටුව දිවි ගෙවන්නෙමි
(viii) ධාර්මිකව නීතිගරුකව යුක්තිගරුකව රට පාලනය කරමින් මව්බිමේ ආරක්ෂාව උදෙසා නැගීසිටීම
(ix) 1. පාසලේ උදෑසන රැස්වීම
2. ජාතික දින උත්සවය ආදී වශයෙන්
(x) 1. මංගල, සුමන, රේවත, සෝභිත බුදුරජාණන් වහන්සේලා බුද්ධත්වයට පත්වූයේ නාගස් සෙවණේය.
2. මෛත්‍රී බුදුන් බුදුවන්නේ ද නා ගසක් සෙවණේ ය.

02 (i) සීල, සමාධි, ප්‍රඥා
(ii) සම්මා කම්මන්ත යනු යහපත් ක්‍රියාවල නිරතවීමයි.
(iii) 1. මහත්වූ භෝග සම්පත් ලැබීම.
2. කීර්තිය පැතිරීම.
3. පිරිස්මැද නොබියව කටයුතු කිරීමට හැකිවීම.
4. මරණයට බිය නැති වීම.
5. මරණින් මතු සුගතියෙහි ඉපදීම.

03 (i) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා
(ii) 1. ආහාරපාන සපයාදීම.
2. අවශ්‍යතා ඉටුකරදීම.
3. පරම්පරාව රැකගැනීම.
4. පරපුරෙන් පැවරී ඇති දේපල ආරක්ෂා කිරීම.
5. දෙමාපියන් මියගියපසු පිංකම්කොට පිං අනුමෝදන් කිරීම.
(iii) උදේ සවස වැඳීම ආදී වශයෙන් සිසුවා ලියා ඇති පිළිතුර සලකා ලකුණු ලබාදෙන්න.

04 (i) පංචශීලය
(ii) සතුන් නොමැරීම / සොරකම් නොකිරීම / කාම මිත්‍යාචාරයේ නොයෙදීම (පිටුව 62)
(iii) සිසු පිළිතුරු සලකා ලකුණු ලබාදෙන්න.

05 (i) 1. පොහෝ දිනවල දී
2. උපන්දිනයේදී ආදී වශයෙන්
(ii) සද්ධාය සම්පදිත්තේන - දීපේන තමධංසිනා
තිලෝක දීපං සම්බුද්ධං - පූජයාමි තමෝනුදං
(iii) 1. මලු ඇමදීම
2. මල් ආසන පවිත්‍ර කිරීම ආදී පහක්

06 (i) නතං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති
යස්ස අස්සුමුඛෝ රෝදං - විපාකං පටිසේවති
(ii) යම් ක්‍රියාවක් නිසා පසුතැවීම ඇතිවේද කඳුළු පිරි දෑසින් යුතුයව
අඬමින් විපාක විඳීමට සිදුවේද එවැනි ක්‍රියා නොකිරීම යහපත් ය.
(iii) සිසු පිළිතුරු සලකා ලකුණු ලබාදෙන්න.

07 (i) අනිත්‍යතාව
(ii) ළදරුවිය / ළමාවිය / තරුණවිය
(iii) සිසු පිළිතුරු සලකා ලකුණු ලබා දෙන්න.